# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෘතීය පරීක්ෂණය (බාහිර) - 2009
2010 අගෝස්තු / සැප්තැම්බර්

## සමාජීය විද්‍යා පීඨය

### ඉතිහාසය- HIST –E3015

ශ්‍රී ලංකාවේ ඉතිහාසය (ක්‍රි. ව. 1597 - 1972 දක්වා)

<u>ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.</u>

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි    කාලය : පැය 03 යි

---

01. පෘතුගීසීන් කෝට්ටේ රාජධානිය තුළ අනුගමනය කළ ආර්ථික ප්‍රතිපත්තියේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න.

02. "තමන්ට එරෙහිව පැවති අභ්‍යන්තර හා බාහිර සතුරු උවදුරු මැඩලා සිය රාජ්‍ය බලය තහවුරු කර ගැනීමට දෙවෙනි රාජසිංහ රජු සමත් විය." සාකච්ඡා කරන්න.

03. 1766 දී කීර්ති ශ්‍රී රාජසිංහ රජු හා ලන්දේසීන් අතර ඇති වූ ගිවිසුමේ ප්‍රධාන කොන්දේසි සැකෙවින් දක්වා ඉන් උද්ගත වූ ප්‍රතිඵල සමාලෝචනය කරන්න.

04. 1815 දී උඩරට රාජ්‍යයේ බිඳ වැටීමට තුඩු දුන් හේතු පරීක්ෂා කරන්න.

05. 1818 ප්‍රකාශනය ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනයෙහි ලා වැදගත්වන අයුරු විමසන්න.

06. මෙරට කෝපි වතු වගාවේ ආරම්භය හා ව්‍යාප්තිය පිළිබඳව විස්තර කරන්න.

07. 1848 බ්‍රිතාන්‍ය විරෝධී සටන ඇතිවීමට තුඩු දුන් හේතු විග්‍රහ කරන්න.

08. පහත දැක්වෙන මාතෘකා අතරින් **<u>එකක</u>** ඓතිහාසික වැදගත්කම පරීක්ෂා කරන්න.

    1. අමද්‍යප ව්‍යාපාරය
    11. ලංකා ජාතික සංගමය පිහිටුවීම

09. සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරන්න.

10. නිදහස ලබාගැනීමෙන් පසු මුල් දශක දෙක තුළ ශ්‍රී ලංකාව ආර්ථික වශයෙන් මුහුණ දුන් ප්‍රධාන අභියෝග කවරේද?